තේ පර්යේෂණ මණ්ඩලය - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

තේ පර්යේෂණ මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 8 හි 69 ඡේදය ප්‍රකාරව සෑම වාර්තා කරන දිනයකදීම ප්‍රතිපාදන සමාලෝචනය කර, බැදීම් පියවීමට ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවයක් සහිතව සම්පත් පිටතට ගලායාමක් තවදුරටත් හව්‍ය නොවන්නේ නම් ප්‍රතිපාදන ප්‍රතිවර්ත්‍ය කළ යුතු වුවත්, ශාන්ත කූම්බ්ස් වතුයායේ සේවකයන්ගේ 2014 සහ 2019 කාලපරිච්ඡේදයට අදාල දිරිදීමනා ගෙවීම වෙනුවෙන් වෙන්කර තිබුණු රු.1,289,006 ක් වූ ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේ අවසන් වන විටත් සමාලෝචනයක් සිදුකර ගිණුම්වලින් ගැලපීමට කටයුතු කර නොතිබුණි. එම ඉහත ශේෂය තුළ කූම්ස් වතුයායෙන් ඉවත්ව ගොස් ඇති නිලධාරීන් තිදෙනෙකු වෙත දිරි දිමනා ගෙවීම් සඳහා 2016 වෙන් කරන ලද එකතුව රු.382,335 ක ශේෂයක්ද ඇතුළත්ව තිබුණි.	2018 වසරට අදාල දිරි දීමනා ලෙස ගෙවිය යුතු රු.262,336ක මුදල 2017/2018 වසරේ තේ විකුණුම් හලේ සිදුවූ මුදල් වංචාව සම්බන්ධයෙන් වැඩ තහනමට ලක්වූ පුද්ගලයින්ට ගෙවිය යුතු මුදලක් වන අතර ඉතිරි රු.1,026,670 ක මුදල 2015, 2017 හා 2019 වසරවලදී වතු කාර්යය මණ්ඩලයේ දිරි දීමනා සඳහා වෙන්කරන ලද ප්‍රමාණය බව සහ මේවන විට දිරිදීමනා ගෙවීම් අත්හිටුවා ඇති බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.
(ආ)	2018 ජනවාරි 01 දින සිට බලාත්මක වි ඇති රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 සංක්‍රාන්ති විධිවිධාන අනුව ප්‍රාග්ධන ප්‍රදානයක් ලෙස ලැබී ඇති වත්කමක ආයුකාලය මත වත්කමේ අගය ආදායමක් ලෙස හඳුනා ගැනීමට ක්‍රියා කර ඇති අවස්ථාවකදී, වසර 3 ක් තුළ මුළු වත්කමේ වටිනාකම ආදායමට ගැනීමට කටයුතු කළ යුතු විය. එහෙත් පෙර ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් ලැබී 2021 ජනවාරි 01 දින වන විට ආයතනයේ ආදායමට හඳුනා ගත යුතුව තිබූ රු.395,770,540 ක් (Grant &	රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 11 අනුව ප්‍රාග්ධන ප්‍රදානයන් 2025 වර්ෂයේ සිට ආදායමක් ලෙස හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන අතර, දැනට පවත්වාගෙන එන ශේෂයන් ඉදිරි වර්ෂ 03 තුළ විලම්භිත ආදායම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරිමට කටයුතු කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඉදිරි වර්ෂයේදී නිවැරදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.

	Reserves) සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රමිතයේ සංක්‍රාන්තික විධිවිධාන පරිදි ආදායම් ලෙස හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.		
(ඇ)	මණ්ඩලය පිහිටි භූමියේ සහ වතුවල සිටුවා ඇති මහෝගනී, කොස් සහ යුකැලිප්ටස් යනාදී වටිනා ශාක 10,629 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 හි 13 ඡේදය හා 16 ඡේදය ප්‍රකාරව පාරිභෝජ්‍ය ජෛව විද්‍යාත්මක වත්කම් ලෙස හඳුනාගෙන එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	ගස්වල වටිනාකම් තක්සේරු කිරීමේ මූලික කටයුතු රාජ්‍ය දැව සංස්ථාව සමඟ කරමින් සිටින අතර එම කටයුතු අවසන් වූ පසු 2025 වර්ෂයේ ගිණුම්ගත කරන බව.	කඩිනම් වැඩපිළිවෙලක් යොදා අදාල වත්කම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 9 වන ඡේදය පරිදි සේවා සැපයීමේදී පාවිච්චි කිරිම සඳහා හෝ බෙදා හැරීම් කටයුතු සඳහා හෝ පරිභෝජනය සඳහා තබාගෙන ඇති ද්‍රව්‍ය හෝ සැපයුම් ස්වභාවයේ පවතින ද්‍රව්‍ය තොගය ලෙස හඳුනා ගත යුතු වුවද, රසායනාගාර 3 ක පැවති මණ්ඩලයේ පර්යේෂණ හා මෙහෙයුම් කටයුතු සඳහා භාවිතයට ගන්නා එකතුව කිලෝ ග්‍රෑම් 1154 ක් වූ රසායනික ද්‍රව්‍ය වර්ග 163 ක තොගය (ද්‍රව රසායන හැර) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ තොග ලෙස හඳුනාගෙන නොතිබුණු අතර, ඒවායේ සම්පූර්ණ පිරිවැය මිලදී ගත් වර්ෂයේදී පර්යේෂණ වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස දක්වා තිබුණි.	පර්යේෂණ සහ සංවර්ධනය සඳහා දරනු ලබන වියදම් එම වර්ෂය තුලදීම වියදමක් ලෙස හඳුනාගැනීමට කටයුත් කරනු ලබන අතර, අදාල රසායනාගාර තුල තොග ලේඛණයක් පවත්වාගෙන ගොස් ඇත. ඉදිරි වර්ෂයේ සිට මෙම රසායනාගාර තුල ඇති තොග වටිනාකම් ගණනය කර පවත්වාගෙන යාමට කටයුතු කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගැලපීම් සිදු කර නිවැරදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.
(ඉ)	තේ පර්යේෂණ මණ්ඩලයට හිමිකමක් නොමැති, ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ ලියාපදිංචි වාහන 02 ක් රු.250,000 කට ප්‍රත්‍යාගණනය කර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණු බැවින් දේපළ පිරියත හා උපකරණ සහ ප්‍රත්‍යාගණන සංචිතය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	රථයක් අළුත් වැඩියාවෙන් පසු ආදායම් බලපත්‍ර ලබා ගෙන ලියාපදිංචි සංශෝධනය සඳහා ඉදිරිපත් කළ බව හා යතුරුපැදියක් වෙන්දේසි කොට විකුණන ලද බව	නීත්‍යානුකූල හිමිකම් ලබාගැනීමට කටයුතු කළ යුතුය.
(ඊ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 25 (ඇ) ඡේදය අනුව, තොග වර්තමාන ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒමට දායක නොවන පරිපාලන පොදු කාර්ය පිරිවැය තොගයේ පිරිවැයෙන් ඉවත් කර ඒවා දරන ලද කාලපරිච්ඡේදයේ වියදම් ලෙස හඳුනා ගත යුතු බව දක්වා තිබුණද, ඊට අනුකූල නොවන ලෙස ශාන්ත කූම්ස් වතුයායේ නිමි තේ තොගය ගණනය කිරීමේදී ආදායම් ප්‍රකාශයට වියදමක් ලෙස කපා හැරිය යුතු රු.12,219,207	තොග වර්තමාන ස්ථානයට ගෙන ඒමට දායක නොවන පරිපාලන පොදු කාර්ය පිරිවැය තොගයේ පිරිවැයෙන් ඉවත් කර තොග ගණනය කිරිමට 2025 වසරේ සිට ක්‍රියා කරනු ලබන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ගැලපීම් සිදුකර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.

	ක් තොගයේ පිරිවැය ගණනය කිරීමේදී සැලකිල්ලට ගැනීම හේතුවෙන් තොගයේ පිරිවැය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.		
(උ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 28 ඡේදය අනුව දේපල පිරියත හා උපකරණ මුල්වරට හඳුනා ගැනීමේදී එහි පිරිවැයට හඳුනා ගත යුතු අතර, පිරිවැය ලෙස අදල වත්කම වර්තමාන ස්ථානයට හා තත්ත්වය ගෙන ඒම සඳහා දරන ලද වියදම් පිරිවැයේ කොටසක් ලෙස හඳුනා ගැනීම කළ යුතු විය. එහෙත් ඊට අනුකූල නොවන ලෙස 2023 වර්ෂයේ ශාක අභිජනන (Plant Breeding) අංශය වෙත ප්‍රදානයක් වශයෙන් ලද විද්‍යාගාර පර්යේෂණ උපකරණ ගිණුම්ගත කිරීමේදී, රේගු ගාස්තු ඇතුළු වත්කමට අදාළ රු. 9,500,656 ක වියදම් පිරිවැයේ කොටසක් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දේපල පිරියත හා උපකරණ වටිනාකම රු.9,500,656 කින් ද ක්ෂය කිරීම් රු.1,900,131 කින් ද අඩුවෙන් දක්වා තිබුණි.	යන්ත්‍ර සූත්‍ර ගිණුම්ගත කිරීමේදී ආයතනය මගින් දරනු ලබන වියදම් පමණක් ගිණුම්ගත කිරීමට කටුතු කර ඇත. මෙම ගිණුම්කරණ දෝෂය 2025 වර්ෂයේ සිට නිවැරදි කරන බව.	- එම -
(ඌ)	සමාලෝචිත වර්ෂයට අදාළ රු.3,624,341 ක වියදම් 2025 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා උපචිත වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	ගිණුම්කරණ දෝෂය 2025 වර්ෂයේ සිට නිවැරදි කරන බව	- එම -
(එ)	SRL 5050s SUPPORTING Genetic IMP Project සඳහා ලබාදී තිබුණු රු.7,285,885 ක මුදලක් කෙරීගෙන යන ව්‍යාපෘති යටතේ ගිණුම්ගත කර තිබුණද, මීට අදාලව කෙරීගෙන යන ව්‍යාපෘතියක් නොතිබුණි. තවද මෙම ව්‍යාපෘතියට අදාල උපකරණ නිෂ්කාෂණ ගාස්තු සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද මුදල එසේ සටහන් වී තිබුණු අතර, එය ප්‍රදාන හා ලැබීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	කෙරීගෙන යන ව්‍යාපෘති පවතින ගිණුම් ශේෂය රු.7,285,885 ක මුදල ප්‍රාග්ධන සංචිත ගිණුමට මාරුකර එයින් විලම්භිත ආදායම් ලෙස වර්ෂ 03ක් තුළ ගිණුම් තුළින් ගැලපීමට කටයුතු කරන බව.	ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලයට අයත් ශාන්ත කුම්බිස් වතුයායේ 2017 සහ 2018 වර්ෂයන්හිදී සිදු වූ මූල්‍ය වංචාවන් හේතුවෙන් අහිමි වූ රු.10,321,858 ක ශේෂයක් වර්ෂ 06 කට වැඩිකාලයක සිට ණයගැතියන් ලෙස දක්වා තිබුණු අතර, ඊට අදාළ පරීක්ෂණ කටයුතු අවසන් කර වගකිවයුතු පාර්ශවයන්ගෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	සිද්ධියට සම්බන්ධ වූ ශාන්ත කුම්බිස් වතු යායේ නිලධාරීන් තිදෙනාට එරෙහිව චෝදනා පත්‍රයක් විභාග කොට ඔවුන්ගේ වැඩ තහනම්කර අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඉදිරි කටයුතු කරමින් පවතින බව.	නෛතික ක්‍රියාමාර්ග කඩිනමින් සිදු කිරීමත්, අලාභ අයකර ගැනීමට කටයුතු කිරීමත් කළ යුතුය.
(ආ)	2012 සහ 2013 වර්ෂයන්හී කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට සහ තේ මණ්ඩලයට තේ අලෙවි කිරීම මත තේ පර්යේෂණ මණ්ඩලයට ලැබිය යුතු රු.494,194 ක් ශාන්ත කුම්බස් වතුයායේ ණයගැතියන් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල අයකර ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි.	මේ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ලබා දීමට ආයතනය විසින් 2025.05.09 දින පැවති විගණන හා කළමණාකරණ කමිටුවේ නිර්දේශ මත කමිටුවක් පත් කර ඇත. එම වාර්තාව 2025.05.31 දින වන විට ලබා දීමට උපදෙස් දී ඇති අතර එම වාර්තාව ලද විගස අදාල කටයුතු සිදු කරන බව.	ණය මුදල් අය කිරීමට කාලීනව පියවර නොගත් නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගැනීමටත්, නොපමාව ලැබිය යුතු මුදල් අයකිරීමට ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතුය.
(ඇ)	සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ, නැවත සේවයට නොපැමිණි සහ සේවයට පැමිණීමෙන් පසු අනිවාර්යය සේවාකාලය අවසන් වීමට පෙර සේවය අතහැර ගිය නිලධාරීන් 04 දෙනෙකු විසින් 2005 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා මණ්ඩලය සමඟ එළඹී තිබුණු ගිවිසුම් කඩකිරීම හේතුවෙන් අදාළ බැඳුම්කර වටිනාකම වූ රු.15,054,891 ක් 2025 මැයි 16 වන විගණිත දින වන විටත් එම නිලධාරීන්ගෙන් ආපසු අයකර ගෙන නොතිබුණි.	සියලු සිද්ධීන් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඉදිරි කටයුතු කරමින් පවතින බව	කාලීනව අදාල මුදල් අය කිරීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරීමටත්, ලැබිය යුතු මුදල් අයකිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශාන්ත කුම්බිස් වතුයායේ විවිධ තොග සැපයුම්කරුවන් වෙත වර්ෂ 02 සිට 11 දක්වා ගෙවිය යුතු එකතුව රු.1,931,878 ක ණයහිමි ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට හෝ හිමිකම් නොපාන බව තහවුරු වන ණය හිමියන් සඳහා අවශ්‍ය ගැලපීම් කිරීමට හෝ මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.	සවිස්තරාත්මක වාර්තාවක් ලබා දීමට 2025.05.09 දින පැවති විගණන හා කළමණාකරණ කමිටුවේ නිර්දේශ මත කමිටුවක් පත් කර ඇත. එම වාර්තාව 2025.05.31 දින වන විට ලබා දීමට උපදෙස් දී ඇති අතර එම වාර්තාව ලද විගස අදාල කටයුතු සිදු කරන බව.	විධිමත් විමර්ශනයක් සිදු කර තවදුරටත් ගෙවිය යුතු ශේෂ නිශ්චය කර ඒවා පියවීමටත් එසේ නොමැති ශේෂ ආදායමට ගැනීමත් කළ යුතුය.
(ආ)	මණ්ඩලය විසින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සහ මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු වසර 04 ක් ඉක්මවා තිබුණු පිළිවෙලින් රු.480,000 ක සහ රු. 699,717 ක ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද නිරවුල් කර නොතිබුණි.	මහා භාණ්ඩාගාරය වෙත ගෙවියුතු රු 699,717 මුදල ගෙවීම සඳහා කටයුතු කර ඇති අතර . කුඩා තේ වතු සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතු රු 431,728 ක් අයකර ගෙවීමට ඇති රු 480,000 මුදල නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන බව.	- එම -

1.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති / විධානයට යොමුව	විස්තරය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 11.1 ඡේදය මඟින් සංශෝධිත මු.රෙ 756.6	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර අවසන් කිරීමේ කාල රාමුව අනුව මණ්ඩලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරි මුදල් වර්ෂයේ ජුනි 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2023 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2025 මැයි 26 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර ඇති අතර අපහරණය සඳහා ප්‍රමාණවත් භාණ්ඩ නොමැති වීම නිසා අපහරණ වෙන්දේසි කටුතු ඉදිරි වර්ෂයේ කරන තෙක් රඳවා තබාගැනීමට කටයුතු කර ඇති බව.	කාලීනව භාණ්ඩ සමීක්ෂණ පවත්වා වාර්තා ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය.

(ආ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 ඡේදය	2022 හා 2023 වර්ෂයට අදාළ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2025 මැයි 26 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	ඉතා ඉක්මනින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට යොමු කිරීම කටයුතු කරන බව	විධිවිධාන ප්‍රකාරව කාලීනව කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධව පියවර ගැනීමටත් කඩිනමින් වාර්ෂික වාර්තා සභාගත කිරීමත් පියවර ගත යුතුය.
(ඇ)	අංක 2310/29 හා 2022 දෙසැම්බර් මස 14 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිවේදනය කරන ලද රීති මාලාවේ රීති අංක 100	විධිමත් පත්වීමක් ලබන නිලධාරියෙකු වෙත රාජකාරි ලැයිස්තුවක් (Duty List) ලිඛිතව භාරදීමට අදාල අංශවල හෝ ශාඛාවල ප්‍රධානියා අප්‍රමාදව ක්‍රියාකළ යුතු වුවත්, තේ පර්යේෂණ ආයතනයේ නිලධාරීන් සඳහා රාජකාරි ලැයිස්තුවක් ලිඛිතව භාරදීමට කටයුතු කර නොතිබුණි.	තේ පර්යේෂණ ආයතනයේ බොහෝ නිළධාරීන් වෙත රාජකාරි ලැයිස්තු ලබා දී ඇති අතර අනෙකුත් නිලධාරීන් සඳහාද සකස්කර ඇති රාජකාරී ලැයිස්තුන් ඉදිරියේදී ලබා දීමට කටයුතු කරමින් පවතින බව.	විධිමත් පරිදි පරිපාලන කටයුතු නොකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් සඳහා පියවර ගැනීමටත් සියලුම නිලධාරීන් සඳහා රාජකාරී ලැයිස්තු ලබා දීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.56,123,000 ක ඌණතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 12,740,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.68,224,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය. වැටුප් පරිවර්තන හේතුවෙන් පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් ඉහළයාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලයේ විශේෂ ව්‍යාපෘති යටතේ දේශගුණික විපර්යාස සඳහා තේ ශාකයේ අනුවර්තීය ප්‍රතිචාර අධ්‍යයනය කිරීමට 2017 නොවැම්බර් 24 දින රු.12,554,583 ක් වැය කර ඉන්දියාවෙන් මිලදීගත් උපකරණ අපේක්ෂිත පිරිවිතරයන්ට නොගැලපීම හා එහි ක්‍රියාකාරීත්වය අපේක්ෂිත මට්ටමින් නොපැවතීම මත මිලදීගෙන වසර 6 ක් ගතවී තිබුණද පර්යේෂණ සඳහා භාවිතා කළ නොහැකිව නිෂ්කාර්යව පැවතුණි.	මේ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ආයතනය විසින් නම් කර ඇති බේරුම්කරුවන් තිදෙනාගේ මැදිහත් වීමෙන් අදාළ විත්තිකාර පාර්ශවය දැනුවත් කරන ලෙස අධිකරණය දන්වා ඇත. ඒ සඳහා කාලයක් ලබා දෙමින් මීළග නඩු දිනය	අපේක්ෂිත පිරිවිතරයන්ට නොමැති උපකරණ මිලදී ගැනීම හා අපේක්ෂිත කාර්යය ඉටු වී නොතිබීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.

		2025.06.19 දිනට කල් තබා ඇති බව.	
(ආ)	ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා රාජ්‍ය සමාගමක් වෙත 2020 අප්‍රේල් 22 දින රු.4,228,700ක මුදලකට කොන්ත්‍රාත්තුව භාර දී 2020 අගෝස්තු 20 දින රු.1,141,749 ක අත්තිකාරම් මුදලක් එම ආයතනයට ගෙවා තිබුණි. සේවා සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබුණු ලංසු ලේඛන අනුව කොන්ත්‍රාත්තුව පිරිනැමූ දිනයේ සිට දින 120 තුළ වැඩ අවසන් කළ යුතු වුවද, විගණිත 2025 මැයි 26 වනවිට වසර 5 ක් ඉක්මවා ගොස් තිබුණද, එහි කටයුතු අවසන් කර නොතිබුණි.	නිම කළ යුතු වූ මොඩියුල 08 ම මේ න විට නිපදවා අවසන් කර ඇති අතර මූල්‍ය හා ගිණුම්කරණ මොඩියුලය සහ වැටුප් ලේඛන මොඩියුලයට අදාල දත්ත ඇතුළු කිරීම එම අංශවලින් සිදුවිය යුතු වුවත් එහි ප්‍රමාදයක් පවතින නමුත් මේ වන විට එම දත්ත ඇතුළු කිරීම ආරම්භ කර ඇති බව	කාලීනව වැඩ කටයුතු නිම කරවා ගැනීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතු අතර, කාර්ය කඩිනමින් නිම කරවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2019 – 2023 පර්යේෂණ ව්‍යාපෘති සඳහා වූ උපාය මාර්ග සැලසුම ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 242.42 ක් වැයකර තිබුණි. ඒ අනුව ව්‍යාපෘති කාලය තුලදී උපාය මාර්ග සැලසුමේ අරමුණු 01 ට අදාලව වැඩසටහන් සහ ව්‍යාපෘති 172 ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු අතර, ව්‍යාපෘතිය 2024 වර්ෂයේ අවසන් වීමෙන් පසු විගණනය සඳහා ඉදිරිපත් කරන ලද උපාය මාර්ග සැලසුමේ ප්‍රගති වාර්තාව අනුව, උපාය මාර්ග සැලසුමේ අරමුණු 01 ට අදාලව 2023 වර්ෂය වන විට වැඩ සටහන් සහ ව්‍යාපෘති 143 ක සියයට සියක ප්‍රගතියක් ලඟා කර ගැනීමට ඉලක්ක ගත කර තිබුණි. ඒවා අතරින් සැලසුම්ගත කාලය තුල රු.මිලියන 30.12 ක් වැය කර තිබුණු වැඩසටහන් සහ ව්‍යාපෘති 47 ක් සැලසුම් කළ පරිදි අවසන් නොකිරීම, ඉටු නොකිරීම හා කල් දැම්ම වැනි විවිධ හේතු මත උපාය මාර්ග සැලැස්මෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගෙන නොතිබුණි. උපාය මාර්ග සැලසුමේ ඇතුළත් තවත් වැඩසටහන් සහ ව්‍යාපෘති 44 ක ප්‍රගතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාවේ ඇතුළත් නොවීම හේතුවෙන් එම වැඩසටහන් ක්‍රියාත්මක වුවාද, යන්න හෝ ව්‍යාපෘති තුලින් අපේක්ෂිත අරමුණ ළගා කර ගෙන තිබුණේද යන්න සනාථ කර ගැනීමට නොහැකි විය.	මෙම ව්‍යාපෘතීන් බොහොමයක් අදාළ කාල සීමාව තුලදී (2019-2023) අරමුණුගත කාර්යයන් සම්පූර්ණ කර ඇති නමුදු, අළුතින් එලි දක්වන නව ප්‍රභේද විශ්ලේෂණය, මෙන්ම වැඩි දියුණු කළ පලිබෝධනාශක, වල නාශක වැනි දෑ අනවරතව විශ්ලේෂණය කළයුතු බැවින්, ක්‍රියාත්මක (on going) ව්‍යාපෘතීන් ලෙස දක්වා ඇති බව හා එමෙන්ම අවශ්‍ය නිපුණතා සහිත නිලධාරීන් නොමැති වීම නිසා ද සමහර ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට නොහැකි බව.	මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා වැය කළ මුදලට ප්‍රතිලාභ ලබා නොගැනීමට අදාල පාර්ශ්ව වෙත විධිමත් පියවර ගත යුතුය.
(ඇ)	Investigation on adoptive responses of Tea Plant to climate change යන ව්‍යාපෘතියට අදාලව රු.1,903,091 ක් වැය කර මිලට ගත් උෂ්ණත්ව පාලන උපකරණ අදාල තාක්ෂණික	උක්ත ව්‍යාපෘතියට අදාළ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය ප්‍රධාන සහ මූලික උපකරණය වන වර්ධන	යෝජිත නීති ක්‍රියාමාර්ග කඩිනම් කිරීමටත්, වෙනත් විකල්ප ක්‍රියා මාර්ග ගෙන විධිමත් පරිදි

	නිර්ණායක හා එකඟ නොවීම මත අදාල සැපයුම්කාර ආයතනයට එරෙහිව නඩුවක් පවරා තිබුණ අතර, අදාළ උපකරණය නොමැතිවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය වසර 5 කට අධික කාලයක් නතර කර තිබුණි.	කට්රයට අවශ්‍ය පරිසර තත්වයන් නියමිත පරිදි පවත්වා ගෙන යා නොහැකි බව නිරීක්ෂණය වූයෙන් මේ බව සැපයුම්කාර සමාගම වෙත දැනුම් දුන්න ද නිසි පරිදි මෙම උපකරණය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. මේ පිළිබඳ ඉන්පසු විමර්ශනය කිරීමෙන් පසු, නීති ක්‍රියාමාර්ග ගැනීම සඳහා එළඹ ඇත.	මෙම ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාවට නැංවීමට කටයුතු කිරීමත් කළ යුතුය.
(ඉ)	2018 වර්ෂයේ ඉදිකිරිම් ආරම්භ කර ඇති ශාන්ත කුම්බස් වතුයායේ තේ අලෙවිසැලක් සඳහා පිරිසැකසුම් කරන ලද කන්ටේනර් ප්‍රදර්ශනාගාරයක් ස්ථාපිත කිරීමේ කාර්යය මේ දක්වා අවසන් කර නොතිබුණු අතර ඒ සඳහා වැය කර තිබුණු රු. 760,604 ක මුදලක් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි.	දැනට තේ අලෙවිසැලේ කටයුතු නවතා ඇති අතර මෙ සඳහා වියදම් වු මුදල නැවත ලබා ගැනිම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	නෛතික කටයුතු කඩිනම් කිරීමත්, විධිමත් අධ්‍යයනයක් නොකර මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත අදාල නිලධාරීන් සම්බන්ධව විධිමත් විනය පියවර ගැනීමත් කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ කෙරිගෙන යන ව්‍යාපෘති ලෙස දක්වා ඇති එකතුව රු.18,345,666 ක් වු ව්‍යාපෘති 14 ක් වසර 2 ත් 5 ත් අතර කාලයක සිට අක්‍රියව පැවතුණි.	අක්‍රිය ව්‍යාපෘතීන් ලෙස හඳුන්වා දී ඇති ව්‍යාපෘතීන්, බාහිර අරමුදල් යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් වේ. ඒ අතරින් එක් ව්‍යාපෘතියක් හැර අනෙකුත් පර්යේෂණ ව්‍යාපෘතීන් නිමකර අවසන් වාර්තා ඉදිරිපත් කිරීම් සිදු කර ඇති බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා ව්‍යාපෘති අක්‍රීය වීමට අදාල හේතු අනාවරණය කරගෙන ඊට අදාල පියවර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ශාන්ත කුම්බ්ස් වතු යායේ 2017 – 2024 දක්වා වු කාලපරිච්ඡේදය තුල නිෂ්පාදන නිමි තේ ප්‍රමාණයේ අඛණ්ඩ පහළ යෑමක් වාර්තා වේ. ඒ අනුව 2017 වර්ෂයේ කිලෝ ග්‍රෑම් 374,893 ක් ව පැවති වාර්ෂික නිෂ්පාදනය 2024 වර්ෂය වන විට කිලෝ ග්‍රෑම් 254,050 දක්වා අඩුවී තිබුණු අතර, එය 2017 වර්ෂයට සාපේක්ෂව සියයට 32 ක අඩුවීමක් පැවතුණි. තවද, සමාලෝචිත වර්ෂයේ නිමි තේ නිෂ්පාදනය 2023 වර්ෂයට සාපේක්ෂව සියයට 76 ක අඩුවීමක් හෙවත් කිලෝ ග්‍රෑම් 76,113 ක අඩුවිමක් වන බවද වැඩිදුරටත් නිරීක්ෂණය විය.	මෙහිදි වතුයායේ තේ නිෂ්පාදනයේ විශාල වෙනසක් සිදු වී නොමැත. 2017 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ මිලදි ගනු ලබන තේ ප්‍රමාණය තරඟකාර්ත්වය මත අඩු වී ඇතිබව.	විධිමත් විමර්ශනයක් සිදු කර නිෂ්පාදනය අඩු වීමට අදාල හේතු සොයාගෙන ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමටත්, නිෂ්පාදන වර්ධනය කර ගැනීමට වැඩපිළිවෙලක් යෙදීමටත් කටයුතු කළ යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තේ පර්යේෂණ මණ්ඩලයට අයත් තලවකැලේ ලැමලියර් වතුයායේ හෙක්ටයාර 1.367 ක භූමි ප්‍රමාණය, කර්මාන්තශාලාව හා සියලුම ගොඩනැගිලි 2003 වර්ෂයේදී පෞද්ගලික සමාගමකට වසර 50 ක කාලපරිච්ඡේදයක් සඳහා බදු දී තිබුණද ගිවිසුම් ප්‍රකාරව බදු කුලී නොගෙවීම මත 2016 වර්ෂයේදී අදාළ දේපළ නැවත අත්පත් කරගෙන තිබුණු නමුත් අත්පත්කරගත් දින සිට 2025 මැයි දක්වා එනම් වසර 09 ක් ඉකුත් වී ඇතත් එම වත්කම් ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.	ගොඩනැගිලි වල භාවිතය හා නඩත්තුව සඳහා කමිටුවක් පත් කොට එම නිරීක්ෂණ අනුව කටයුතු කරන ලෙසට තේ පර්යේෂණ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති අතර ඒ අනුව කටයුතු කරමින් පවතින බව.	විධිමත් පරීක්ෂණයක් පවත්වා හිඟ බදු කුලී පවතී නම්, ඒවා අයකර ගැනීමට හා ඒවා අය නොකළ නිලධාරීන් සම්බන්ධව පියවර ගැනීමටත් වසර 9 ක් ගොඩනැගිල්ල ඌන උපයෝජිතව තබා ගැනීමට අදාල නිලධාරීන් සම්බන්ධව පියවර ගැනීමත් කළ යුතුය.

4. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලයේ අනුමත කාර්යය මණ්ඩලය තුළ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු 36 ක් පැවතියද සමාලෝචිත වර්ෂයේදී ඉන් තනතුරු 26 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු තනතුරු අතර අංශ ප්‍රධානී තනතුරු 08 ක්ද ප්‍රධාන පර්යේෂණ නිලධාරී තනතුරු 11 ක්ද ප්‍රධාන උපදේශන නිලධාරී තනතුරු 04 ක්ද ඇතුළු තනතුරු 23 ක් අභ්‍යන්තර උසස්වීම් මඟින් පිරවිය යුතු වුවද වර්ෂ 05 කට වැඩි කාලයක සිට මෙම තනතුරු පුරප්පාඩුව පැවතුණි. තවද, තෘතික මට්ටමේ කණිෂ්ඨ කළමනාකරු හා මෙහෙයුම් නිලධාරී තනතුරු 47 ක්ද, ද්විතියික මට්ටමේ කළමනාකරණ සහකාර තනතුරු 83 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 88 ක් ද වශයෙන් මුළු තනතුරු 218 ක් පුරප්පාඩුව පවතින අතර, එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 61 ක ප්‍රතිශතයකි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, මෙම තනතුරු පුරප්පාඩුව පැවතුණි. තවද, මානව සම්පත් කළමනාකරණය සඳහා නීති රීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේදීද අවසන් කර නොතිබුණි.	මේ වන විට තේ පර්යේෂණ ආයතනයේ අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව ප්‍රධාන අංශ ප්‍රධානි තනතුරු පිරවීම සඳහා 2025 අප්‍රේල් මස 30 දිනැති ලිපිය මඟින් රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සමාලෝචන කමිටුවට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බව.	පවතින කාර්යය භාරය අනුව කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර අවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට ක්‍රියාකළ යුතුය.